**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

**(අ) දේපළ පිරියත හා උපකරණ**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) හි කාර්යාලීය උපකරණ | 2021 වර්ෂයේදී ACA 6 ප්‍රකාශනය අප විසින් සකස් කළේ නම් ආරම්භක ශේෂය ලෙස 2020 අවසාන ගිණුමෙහි | පෙර වර්ෂ අවසාන ගිණුම් ශේෂයන් |

| | | | |
|---|---|---|---|
| | හා පරිඝණක උපකරණ යන වත්කම් හි ආරම්භක ශේෂයන් හා 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-06) අවසාන ශේෂයන් අතර රු.129,899 ක වෙනසක් පැවති අතර, එම වෙනසට හේතු ගිණුම් සටහන් මගින් ඉදිරිපත් කර නොතිබුණි. | තිබූ ශේෂය යොදා ගැනීමට හැකිව තිබුණු නමුත් 2021 වර්ෂයේ සිට ACA6 ප්‍රකාශනය සකස් කිරීම වෙනුවට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ප්‍රකාශනය ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී තිබීම හේතුවෙන් ඒ අනුව කටයුතුකර ඇත. | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) දෙපාර්තමේන්තුවට අයත් පිරිවැය රු.129,715,000 ක වාහන 19 ක් ඇතුළත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත වෙනත් ආයතන වලින් ලැබුණු වාහන 19 වටිනාකම් 2022 මැයි මස CIGAS පරිගණක පද්ධතිය මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | වාහන වටිනාකම මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | දෙපාර්තමේන්තුවට අයත් රත්මල් වැව ගොවිජන සේවා මධ්‍යස්ථානය භාවිතාකරන ට්‍රැක්ටරයක සහ ලුනුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නවතා ඇති ජල බවුසරයක වටිනාකම 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-06) ඇතුළත් කර නොතිබුණි. | අංක 37 ශ්‍රී 5367 දරන ට්‍රැක්ටර් රථයේ සහ අංක 42-5035 දරන බව්සර් රථයේ ලියාපදිංචිය සහතික කරගැනීම සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් 2022.04.05 දින විමසීමක් සිදු කර ඇත. අදාළ ලියාපදිංචි සහතික ලබා ගැනීමෙන් පසු මෙම වාහන පවරා දීමට කටයුතු කරනු ලැබේ. | වාහන වටිනාකම මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-06) ඇතුළත්ව තිබුණු පිරිවැය රු.18,507,000 ක වාහන 6 ක් භාවිත කරන කාර්යාලය හෝ ස්ථානය, ලියාපදිංචි පොත් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වාහන 06 න් 05 ක් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් අමාත්‍යාංශය සහ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2019 හා 2020 යන වර්ෂ වලදී ලිපි මගින් භුවමාරු කර ඇති අතර 300-3812 අංක දරන කාර් රථයක් සහ 32-1180 අංක දරන ජීප් රථයක් වෙන්දේසි කර ඇත. | අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපද වලින් ඉඩම් බදු ආදායම් රැස්කරන අතර, 2021 වර්ෂය අවසන්වන විට පැවති රු.84,916,237 ක හිඟ ආදායම | 2021.12.31 දිනට අයවිය යුතු හිග ඉඩම් බදු ප්‍රමාණයෙන් 2022.03.31 දින වන විට අය කරගෙන ඇති හිඟ බදු ආදායම රු.7,379,493 ක් වන අතර ඉතිරිය ඉදිරියේදී පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කර අයකර ගැනීමට අපේක්ෂා | දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු ආදායම් කාලීනව අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු.45,145,773 ක් වසර 2 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර, 2021 වර්ෂයේදී හිඟ ආදායමෙන් අයකරගෙන තිබුණු මුදල රු.5,181,448 ක් පමණක් විය. | කරමි.<br>• බදුකරුවන්ට හිඟ බදු ගෙවන ලෙසට 95/5 චක්‍රලේඛයේ ආකෘතිය අනුව දැනුවත් කිරීම<br>• බදුකරුවන් වෙනුවෙන් කොට්ඨාශ දින පැවැත්වීම<br>• සංවර්ධන නිලධාරීන් /ජනපද නිලධාරීන් මඟින් ක්ෂේත්‍රයේ දී බදුකරුවන් බදු ගෙවීම සඳහා දැනුවත් කිරීම<br>• ටෙන්ඩර් මගින් ඉඩම් ලබාගෙන මේ දක්වා බදු ගෙවා නොමැති හා සංවර්ධනය කර නොමැති බදුකරුවන් ඉ.සං.ආ. පනතේ 106 වගන්තිය මඟින් කාර්යාලයට කැඳවා පරීක්ෂණ කටයුතු කිරීම<br>• නිසි පරිදි බදු ගෙවන බදුකරුවන්ට බදුකර කඩිනමින් ලබා දීමට සැලැස්වීම. | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් බදු අය කරනු ලබන ඉඩම්වලට අදාළව බදු ලෙජරයක් පවත්වාගෙන නොයාම හේතුවෙන්, 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති රු.105,312,901 ක ඉඩම් හා අනෙකුත් බදු කුලී ආදායම සහ රු.මිලියන100 ක් වූ ඇස්තමේන්තුගත ආදායමේ නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. | ප්‍රධාන කාර්යාලය විසින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිටින දීර්ඝ කාලීන බදු කරුවන් වෙනුවෙන් බදු ලෙජර පවත්වාගෙන යාම ප්‍රායෝගිකව කළ නොහැකි බැවින් අන්තර් පළාත් කාර්යාල පිහිටුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා කාර්යයන් විමධ්‍යගත කර ඇත. තවද මෙම කාර්ය පහසු කිරීම සඳහා රජයේ ඉඩම් තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය (e-slims) හඳුන්වා දී ඇති අතර සියළුම දීර්ඝ කාලීන බදු කරුවන් මෙයට ඇතුළත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. | දෙපාර්තමේන්තුව බදු දී ඇති ඉඩම්වලට අදාළව ඉඩම් බදු ලෙජරයක් පිළියෙලකර ඒ අනුව වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සකස්කළ යුතුය. |
| (ඇ) | දෙබරවැව, මහියංගනය, මොනරාගල සහ අම්පාර යන අන්තර් පළාත් කාර්යාල 4 න් පමණක් 2020 සහ ඊට පෙර වර්ෂවලට අදාළව රු.20,676,543 ක මගහැරුණු ඉඩම් බදු ආදායමක් සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන තිබුණි. ඒ අනුව පෙර වර්ෂවලට අදාළ හිඟ ඉඩම් බදු සම්බන්ධයෙන් නිසි පරිදි වාර්තා පවත්වාගෙන ගොස් නොමැති බව තහවුරු වන අතර සම්පූර්ණ බදු ලෙජරයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒ.සී.ඒ. 1(i) ආකෘතිය මගින් 2021 වර්ෂයේ දෙසැම්බර් 31 | අදාළ මුදල් මඟ හැරුණු හිඟ බදු නොවන අතර 2021 වර්ෂයේදී හඳුනාගත් හිඟ බදු වේ.<br>තක්සේරු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මණින ලද ඉඩම් විස්තර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවනු ලබන අතර වාර්ෂික බදු මුදල සකස් කර ගිණුම්ගත කළ හැකි වන්නේ එසේ තක්සේරු කිරීමෙන් අනතුරුවය. ඉඩම් බද්ද ගණනය කරනු ලබන්නේ භුක්තිය භාර දීමෙන් පසු වසර කිහිපයකට පසුවය. මෙම ක්‍රියාවලියේ දුර්වලතා හඳුනාගැනීමෙන් පසු 2021.10.13 දිනැතිව අංක 2021/6 දරන රජයේ ඉඩම් වලින් | ඉඩම් බදු ආදායම් අදාළ වර්ෂයේදීම හඳුනාගත හැකි වන ලෙස ඉඩම් බදු ලෙජරයක් පවත්වාගත යුතුය. |

| | |
|---|---|
| දිනට වාර්තා කර තිබුණු රු.84,916,237 ක හිඟ බදු ආදායමේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමට පත්විය නොහැකි විය. | අයවිය යුතු බදු ආදායම් විධිමත් කිරීම මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කළ චක්‍රලේඛනය අනුව දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කරනු ලබන ඉඩම් වලට අදාළව දළ තක්සේරුව මත බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයන් 07 ක් සඳහා රු.140,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 305 කින් වැඩි වීමකි. වැය විෂයක් සඳහා වෙන් කර තිබුණු රු.2,000,000 ක් සම්පූර්ණයෙන් වියදම්කර නොතිබුණු අතර, ඉතිරි වැය විෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණු මුළු මුදල රු.42,555,588 ක් විය. ඒ අනුව ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් හෙවත් රු.97,444,412 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉතිරි වී තිබුණි. | අංක 21/1596/304/134 හා 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඉතිරිව තිබුණු ප්‍රතිපාදන වලින් බැඳීම් ඇති කරගෙන නොතිබුණු සියලුම කටයුතු අත්හිටුවමින් ප්‍රතිපාදන අවුරා තබන ලදි. | සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. අවුරා තැබීම් පිළිබඳ වාර්තා කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | විගණන නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මු.රෙ. 104 (3) හා (4) | - | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ විට පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු වුවත්, 2019 හා 2020 වර්ෂවල වාහන 05 කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දින 18 ත් මාස 4 ත් අතර කාල පරාසයක් ගතවී තිබුණු අතර ඊට අදාළ පරිපූර්ණ වාර්තා 2022 මාර්තු 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | රටතුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනයන්හි රාජකාරි කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගැනීමට නොහැකි වීම නිසා මෙම අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104(4) ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී ඇත. මේ වන විට අදාළ වාර්තා සකස් කිරීමට කටයුතු කරමින් ඇත. | මු.රෙ. 104 (3) හා (4) ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) මු.රෙ. 371 (2) | 143,500 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය හැකිවුවත්, 2021 වර්ෂයේ පෙබරවාරි 15 දින මාණ්ඩලික නිලධාරියෙකු වෙත අදාළ සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දී තිබුණු අතර තත්‍ය වියදම රු.92,765 ක් වී තිබුණි. | මෙම අත්තිකාරම් මුදල ලබා දී ඇත්තේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා වන අතර සේවකයින් කිලිනොච්චිය සංචාරක බංගලාවේ නවාතැන් ගැනිම හේතුවෙන් සැලසුම්කළ නවාතැන් වියදම්, සංග්‍රහ වියදම්, ඉන්ධන හා ලිපිද්‍රව්‍ය වැනි වියදම් අවමකරගත හැකි වීම හේතුවෙන්, ඇස්තමේන්තුගත පිරිවැය අවමකරගත හැකි විය. කෙසේ වුවද, සීමාව ඉක්මවා නොයන පරිදි අතුරු අග්‍රිම ලබා නොදීමට වග බලා ගන්නා ලෙස අදාළ නිලධාරින් දැනුවත් කොට ඇත. | අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරන්නේ නම් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |
| (iii) මු.රෙ. 371 (5) | 166,364 | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එය පියවිය යුතු වුවත් 2021 වර්ෂය තුළ අවස්ථා 11 කදී ලබා දී තිබුණු අත්තිකාරම් පියවීමට අදාල කාර්යයන් නිමවී දින 24 සිට මාස 04 සිට දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. | රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත, රාජකාරි අවශ්‍යතාවය මත හා සීමා සහිතව නිලධාරීන් කැඳවීම හේතුවෙන් අත්තිකාරම් පියවීම් ප්‍රමාද වී ඇත. ඉදිරියේදී එසේ නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම නොපමාව පියවීම කළ යුතුය. |

(ආ) රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ

--------------

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් වාහන 30 ක් සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | 2021/2022 වර්ෂයේ රටතුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට නොහැකි වී ඇති අතර දැනට රටතුළ පවතින ඉන්ධන අර්බුදය සහ සීමිත ප්‍රතිපාදන හේතුවෙන් 2022/2023 වර්ෂය සඳහාද ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමේද ගැටලු ඇත. එබැවින් දැනට අවසන් වරට සිදුකළ ඉන්ධන පරීක්ෂාවන්හි අනුමත දැවෙන ඉන්ධන ප්‍රමාණය අනුව වාහන ධාවනය සිදුකෙරේ. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂණ කටයුතු සිදුකළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම් 02 ආකෘතිය | - | චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව අනෙකුත් රාජ්‍ය ආයතන අතර නීති, රීති, රෙගුලාසි හා අනපනත් ආදි නෛතික රාමුවක් තුළ රජයේ ඉඩම් සම්බන්ධයෙන් සිය කාර්යය භාරය ඉටු කරනු ලබන බැවින් දෙපාර්තමේන්තුවට අනන්‍ය වූ ක්‍රමවේදයක් තුළ මානව සම්පත් සැලැස්ම සකසාගත යුතු වේ. 2022 වර්ෂයේ දෙවන කාර්තුව තුළ මෙය අවසන් කිරීමේ හැකියාව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව මෙම දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සැකසිය යුතු වුවත්, පසු ගිය කාලවකවානුව තුළ පැවති තත්වය මත එය සැකසීමේ යම් ප්‍රමාදයක් සිදු වු අතර, මෙම වර්ෂය තුළ අවසන් කිරීමේ හැකියාව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ<br>-------------- | | | | |
| | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන චක්‍රලේඛයේ 4 වගන්තිය | 1,143,800 | 2018 වර්ෂය සහ ඉන්පසු මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ක්‍රියාකර නොපමාව නිරවුල් කළ යුතු බව දක්වා ඇතත් 2021 වර්ෂය තුළ දී මිය ගිය නිලධාරියෙකුගෙන් සහ විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදලක් 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමෙහි ඇතුළත් කර තිබුණි. | සේවකයින් 04 දෙනෙකුට අදාළ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අය කර පියවා ඇත. අනෙකුත් සේවකයින් 04 දෙනාට පරිවර්තිත විශ්‍රාම වැටුප හෝ විශ්‍රාම පාරිතෝෂික මුදල් ගෙවීම සිදුවන අවස්ථාවේදී ණය ශේෂ පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වමි. | ණය ශේෂ නොපමාව නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 41 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා සාදන ලද නියෝගයන්හි 6 වන නියෝගය | - | RTI 03 ආකෘතියට අනුව තොරතුරු අයදුම්පත් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වුවත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි | RTI 03 ආකෘතියට අනුව තොරතුරු අයදුම්පත් ලේඛනයක් පවත්වාගෙන යාමට මේ වන විට කටයුතු කර ඇති අතර, තොරතුරු විමසන පුද්ගලයන් වෙත අදාළ කාල සීමාව තුළ තොරතුරු ලබා දීමට කටයුතු කරමින් පවතී. | RTI 03 ආකෘතියට අනුව තොරතුරු අයදුම්පත් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |

**2.4** තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු තැන්පතු ගිණුම් 03 කට අදාළව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 ට පැවති රු.68,794,932 ක ශේෂයෙහි ඇතුළත් වසර 02 ඉක්ම වූ රු.1,138,699 ක තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02 ක ඉක්ම වූ තැන්පතු වටිනාකමින් රු.86,651 ක මුදලක් 2022 මැයි දක්වා කාලය තුළ දී නිරවුල්කර ඇති අතර ඉතිරි තැන්පත්කරුවන් දැනුවත්කර 2022 වර්ෂයේදී ඉල්ලීම් ඉදිරිපත් නොවුනහොත් රජයේ ආදායමට බැර කර නිරවුල් කිරීමට කටයුතු කරමි. | වසර 2 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

**(අ)** රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය **(e Slims)**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර, 2021 වර්ෂය අවසන් වන විට ඒ වෙනුවෙන් දරා තිබූ පිරිවැය රු.159,456,247 ක් වී තිබුණි. වර්ෂ 07 කට වැඩි කාලයක සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණ ද, අදාළ දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ ඉඩම් කැබලි ප්‍රමාණය 1,306,917 ක් වූ අතර 2021 වර්ෂයේ දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කළ ඉඩම් කැබලි 100,000 න් 62,785ක් පමණක් ඇතුළත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් ඇතුළත් කළ යුතු ඉඩම් කැබලි සංඛ්‍යාව සහ ඒ සඳහා ගතවන කාලය පිළිබඳව ඇස්තමේන්තුවක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේදී ඉඩම් කැබලි 100,000 ක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණද Covid-19 වසංගත තත්වය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයේ ක්ෂේත්‍ර නිලධාරින් ක්ෂේත්‍රය පරික්ෂා කිරීමට යාම ගැටළු සහගත වූ බැවින් ඉඩම් කැබලි සම්බන්ධව සම්පූර්ණ තොරතුරු ඇතුළත් කිරීමට නොලැබුණි. කෙසේ වෙතත් එම වර්ෂය තුළදි ඉඩම් කැබලි 62,785 ක් පමණක් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණි. | රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් ඇස්තමේන්තු ගත කාලයක් තුළ සකස්කර අවසන්කළ යුතුය. |
| (ii) | රජයේ ඉඩම් බදු දීම තුළින් ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල 09 ක් හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 08 ක් මඟින් සිදු කරනු ලබන අතර 2021 වර්ෂයේ | රජයේ ඉඩම් ආඥා පනත යටතේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක බැහැර කරන ලද සියලුම ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කරන තෙක් නිවැරදි පාලන ගිණුම හෝ හිඟ පාලන ගිණුම e-Slims | අදාළ වර්ෂයේදී රැස්කළ ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු ලබාගත හැකි |

| | | | |
|---|---|---|---|
| | දී රැස් කරන ලද ආදායම හා 2021 වර්ෂය අවසන්වන විට හිඟ බදු වටිනාකම සම්බන්ධ තොරතුරු මෙම පද්ධතිය මඟින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පද්ධතිය මගින් මුද්‍රණය කළ නොහැක. 2022.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හා දීමනා පත්‍ර සකස් කිරීම මෙන්ම රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු අනුමැතීන් ලබා ගැනීම, බදු කර සකස් කිරීම හා වාර්ෂික අවසර පත්‍ර නිකුත් කිරීම e-Slims පද්ධතිය මගින් පමණක් සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව හිඟ බදු මුදල් පිළිබඳ තොරතුරු පද්ධතිය හරහා ඉදිරියේදී ලබා ගැනීමේ හැකියාව පවතී. | ආකාරයට තොරතුරු පද්ධතිය පවත්වාගෙන යා යුතුය. |
| **(iii)** | 2021 වර්ෂයේ දී රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) මගින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව දීමනා පත්‍ර 10,000 ක් නව බලපත්‍ර 2000 ක් හා දීර්ඝකාලීන බදු බලපත්‍ර 500 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ දීමනා පත්‍ර, බලපත්‍ර හා බදුකර සංඛ්‍යාව පිළිවෙළින් 7414 ක් 484 ක් හා 75 ක් වී තිබුණි. | 2021 වර්ෂය තුළදී e-Slims පද්ධතිය මගින් දීමනාපත්‍ර 10,000 මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණු අතර එම වර්ෂය තුළදී මුද්‍රණය කිරීමට හැකියාව ලැබී තිබුණේ දීමනාපත්‍ර 7,414 ක් පමණි. එසේම 2021 වර්ෂය සඳහා e-Slims පද්ධතිය හරහා නව බලපත්‍ර 2000 ක් හා දීර්ඝකාලීන බදු බලපත්‍ර 500 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, නව බලපත්‍ර 484 ක් සහ දීර්ඝකාලීන බදු බලපත්‍ර 75 ක් පමණක් නිකුත් කිරීමට වර්ෂය පුරා පැවති කොරෝනා වසංගතය තත්ත්වය හේතු වී තිබුණි. | වාර්ෂික ඉලක්ක සැලසුම්කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ඉඩම් අමාත්‍යාංශයේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉඩම් තොරතුරු රැස් කිරීමේ දීප ව්‍යාප්ත සංගණනයක් 2020 වර්ෂයේ අවසන් කාර්තුවේ ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා සංගණන ආකෘති පත්‍ර මිලියන 10 ක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් නොමිලේ මුද්‍රණය කර දිවයින පුරා ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි බෙදා හැර තිබුණි. අදාළ සංගණන කටයුතුවල ප්‍රගතිය 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම සංගණනයෙන් හඳුනාගත් රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත නොහැකිව තිබුණි. | රජයේ ඉඩම් පිළිබඳව සංගණනයක් සිදු කර ඉඩම් තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා 2020 වර්ෂයේ අග භාගයේ දී කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව, එහි මූලික කාර්යය ලෙස තොරතුරු රැස් කිරීමේ පත්‍රිකා මුද්‍රණය කර සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමුකර ඇති අතර මේවන විටත් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් තොරතුරු එකතු කරමින් පවතී. මෙම වැඩසටහන 2022 ජූනි 30 දිනෙන් අවසන් වීමට තිබුණ ද, රට තුළ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් එකී කාල සීමාව 2022 ඔක්තොම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇත. | ඉඩම් සංගණන කටයුතු කඩිනමින් අවසන්කර රැස්කරගනු ලබන තොරතුරු අනුව දෙපාර්තමේන්තු ඉඩම් ලේඛන සහ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) බිම්සවිය ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| (i) | බිම්සවිය ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී බිම්සවිය ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කච්චේරි පැවැත්වීම, බලපත්‍ර නිකුත් කිරීම, දීමනාපත්‍ර නිකුත් කිරීම, ජංගම සේවා පැවැත්වීම, කොට්ඨාශ දින පැවැත්වීම සහ ගැටලුවලට විසඳුම් සෙවීම යන ක්‍රියාකාරකම් සැලසුම්කර තිබුණු අතර, ඉඩම් කච්චේරි පැවැත්වීම හැර අනෙක් කාර්යයන්හි ප්‍රගතිය සියයට 4 ත් 43 ත් අතර පහළ පරාසයක පැවතුණි. | ජාතික ප්‍රතිපත්තිය මත කිසිදු නිත්‍යානුකූල ලියවිල්ලක් නොමැතිව රජයේ ඉඩම් භුක්ති විදින අයට නීත්‍යානුකූල ලියවිලි ලබා දීමට කටයුතු කිරීම හේතුවෙන් 2021 වර්ෂයේ මුල් කාර්තුවේදී සාමාන්‍ය වර්ෂයකට වඩා විශාල ඉඩම් කච්චේරි ප්‍රමාණයක් පැවැත්විය. 2021 වර්ෂය තුළ අන්තර් පළාත් කාර්යාල සහ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු යටතේ බලපත්‍ර හා දීමනාපත්‍ර 35,005 ක් සහ 19,906 ක් නිකුත් කරන ලදී. 2021 වර්ෂය පුරා පැවති කොවිඩ් වසංගත තත්වය සමඟ රට වරින්වර වසා දැමීම හේතුවෙන් සැලසුම් කළ ක්ෂේත්‍ර රාජකාරීන් සිදුකිරීමට නොහැකි වී ඇත. | සැලසුම්ගත ඉලක්ක ළඟාකර ගැනීමට කායීක්ෂමව කටයුතු කළ යුතුය. |
| (ii) | බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 හි ඉඩම් කච්චේරි 20 ක් පැවැත්වීමට සැලසුම් කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ඉඩම් කච්චේරි 177 ක් පවත්වා තිබුණි. ඒ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පමණක් පවත්වා තිබුණු කච්චේරි සංඛ්‍යාව 92 ක් වූ අතර එය වාර්ෂික ඉලක්කයට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව පැවැත්විය හැකි ප්‍රශස්ත ඉඩම් කච්චේරි සංඛ්‍යාව පිළිබඳ අවධානය යොමු නොකර ඉතා පහළ ඉලක්කයක සිට සැලසුම් සකස් කර තිබුණි. | 2020 – 2021 වර්ෂයන් හි පැවති වාතාවරණය අනුව ජනතාව රැස්කරමින් ඉඩම් කච්චේරි පැවැත්වීමට ඇති අපහසුතාවය මත ප්‍රායෝගිකව පැවැත්වීමට අපේක්ෂිත ඉඩම් කච්චේරි ප්‍රමාණය සැලසුම් ලෙස දක්වා ඇත. එහිදී, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අනුරාධපුරය අන්තර් පළාත් කාර්යාලය මගින් පාලනය වන රජයේ ඉඩම් සහිත ඉඩම් ගැටලු බහුල ප්‍රදේශයක් වන බැවින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විශේෂ මැනුම් වැඩසටහනක් මත අනෙකුත් ආයතනවල ද සහයෝගය ඇතිව සිදු කිරීම නිසා ඉඩම් කච්චේරි වැඩි ප්‍රමාණයක් පවත්වන ලදි. | ප්‍රායෝගිකව ඉටුකළහැකි උපරිම ප්‍රමාණය මත පදනම්ව වාර්ෂික කාර්යයසාධන ඉලක්ක පිහිටුවා ඒවා ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය දක්වා පිළියෙල කළ කාර්යසාධන වාර්තාව මගින් දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් අයකර ගැනීම හා ඊට අදාළ නීත්‍යානුකූල පියවර ගැනීම සහ රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම යන උපාය මාර්ග පිළිබඳ ඇස්තමේන්තුගත ඉලක්ක හා ප්‍රගති පිළිබඳ තොරතුරු ඇතුළත්කර තිබුණද, 2021 වර්ෂය සඳහා පිළියෙල කළ කාර්යසාධන වාර්තාවෙහි එම ඉලක්ක සහ | 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය දක්වන ආකෘතිය පරිශීලනයේ පහසුව අරමුණු කොටගෙන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ලේඛනවල ප්‍රගතිය දක්වා ඇත. එසේ ආකෘතිය වෙනස් කිරීම හේතුවෙන් හිඟ ආදායම් අයකර ගැනීම, | දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් අයකර ගැනීම, අනවසර අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් පියවර ගැනීමට |

| | | |
|---|---|---|
| ප්‍රගතිය ඇතුළත්කර නොතිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීම, අනවසර අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් පියවර ගැනීම සහ ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | අනවසර අත්පත් කර ගැනීම් සහ ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අන්තර්ගත කර නොමැති නමුත්, ඒ සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතු ලේඛනවල ඇතුළත් කර ඇත. | අදාළ ප්‍රගතිය වාර්ෂික කාර්යය සාධන වාර්තා මගින් ඉදිරිපත් කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

----------------

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී මේස පරිගණක 400 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද, අංක 21/1596/134 දරන 2021 අගෝස්තු 30 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් දැනුම් දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදය හේතුවෙන් සැලසුම් සපුරා ගැනීමට නොහැකි වී තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 18 දින පළ කළ පුවත්පත් දැන්වීම සඳහා දරන ලද රු.79,218 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි. | දෙසැම්බර් මාසයේ මුදල් ගෙවීම සඳහා අක් මුදල් නිදහස් කර ගැනීමේ ප්‍රමාදයද ආනයන සීමා පැනවීම නිසා භාණ්ඩ නිශ්චිත කාල රාමුව තුළ සැපයීමේ ප්‍රමාදයද සැලකිල්ලට ගෙන 2021 අගෝස්තු 28 දින මුදල් අමාත්‍යාංශය නිකුත් කල 21/ 1596/134/ අංක දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවිය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂය ආරම්භයේදීම පටන්ගත යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී e-Slims ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික උපකරණ මිල දී ගැනීම සඳහා වෙන්කළ රු.මිලියන 55.92 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදය හේතුවෙන් උපායෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි. | **e** –Slims ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරගෙන යන අතරතුර, රටේ පැවති කොරෝනා තත්වය හා මූල්‍ය අර්බුදය හේතුවෙන්, මුදල් අමාත්‍යාංශයෙන් 2021.08.28 දින නිකුත්කල 21/1996/134 අංක දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයේ (රාජ්‍ය වියදම් සමාලෝචනය) 02 (i) ඡේදය ප්‍රකාරව, නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද, දැනට ආරම්භකර නොමැති මිළදී ගැනීම් අත්හිටුවීමට ලබා දී තිබුණු උපදෙස් අනුව අප දෙපාර්තමේන්තුව අපේක්ෂා කල පරිදි අදාළ තාක්ෂණික උපකරණ මිළදී ගැනීමට නොහැකි විය. | කාලච්ඡේදයේ ප්‍රතිපාදන කාලීනව උපයෝජනය කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී මිලට ගනු ලැබූ මුළු වටිනාකම රු.221,065 ක් වූ ටැබ් යන්ත්‍ර 01 ක්, අඟල් 40 LED රූපවාහිනී යන්ත්‍ර 01 ක් හා සංඛ්‍යාංක බහු මාධ්‍ය ප්‍රොජෙක්ටරයක් 2022 මාර්තු 31 දින වන විටත් අභාවිතව ගබඩාවේ රඳවා තිබුණි. | ටැබ් යන්ත්‍රය කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ජනපද නිලධාරී වෙත ලබා දීමට සැලසුම් කර මිළදී ගෙන තිබුණු අතර එම නිලධාරියා විශ්‍රාම යාම නිසා ටැබ් යන්ත්‍රය නිකුත් කිරීමට නොහැකි වී ඇත. අඟල් 40 රූපවාහිනී යන්ත්‍ර 01 හා සංඛ්‍යාංක බහු මාධ්‍ය ප්‍රොජෙක්ටර 01 රත්මලාන ශ්‍රවනාගාරයේ සවි කිරීමට මිළදී ගෙන ඇති අතර පසුගිය වර්ෂයන් හි පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් පුහුණු කටයුතු මාර්ගගතව සිදු කිරීම නිසා එම අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය. 2022 වර්ෂයේදී එම යන්ත්‍ර 02 උපයෝජනය කිරීමට කටයුතු කරමි. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු අතර අභාවිත භාණ්ඩ ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගත යුතුය. |
| (ආ) | දෙපාර්තුමේන්තුව සතු වාහන 05 ක් වර්ෂ 4 ත් 7 ත් අතර කාලයක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ රඳවා තිබුණු අතර එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 04 ක් අපහරණ නොකර අලුත්වැඩියා කර රාජකාරී සඳහා යොදවා ගැනීමට ඇති හැකියාව පිළිබඳව යාන්ත්‍රික වැඩ මූලික විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව ඉදිරි කටයුතු කරමින් ඇත. එක් වාහනයක අලුත්වැඩියාවන් කිහිපයක් සිදු කර ඇති අතර මේ වන විට එම රථය ධාවනය කිරීමට සුදුසු තත්ත්වයේ පවතී. | භාවිතයට නොගන්නා වාහන අලුත්වැඩියාකර ධාවනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී සිදුවී තිබුණු වාහන 06 ක අනතුරු සම්බන්ධයෙන් එකතුව රු.1,988,262 ක් වූ අලාභයෙන් රු.1,079,050 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතුකර නොතිබුණි. | අංක PD-9781 දරන වාහනයට සිදු වූ අලාභය හානි පාඩු ලේඛනයෙන් කපා ඉවත් කර ඇත. අංක PG-9778 දරන වාහනයට සිදු වූ අනතුරට අදාළ මු.රෙ. 104 (4) වාර්තාව සඳහා ඉ.කො.ජ. අනුමැතිය ලැබී ඇති අතර මු.රෙ. 109 අනුව හානි පාඩු පොත්වලින් කපා හැරීමට වාර්තා කරමින් පවතී. අංක PD-9189 සහ PF-6076 දරන වාහන වලට අනතුරු වලින් වූ අලාභය අදාළ රක්ෂණ සමාගම් වෙතින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. අංක PC-2501 දරන වාහනය සම්බන්ධයෙන් රක්ෂණ සමාගම විසින් අලුත්වැඩියාව සිදුකළ සමාගම වෙත මුළු මුදල ගෙවා ඇති බව දන්වා ඇති අතර අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) වාර්තාව සකස් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. අංක PF-6074 දරන වාහනයට අදාළ මු.රෙ.104 (4) වාර්තාව ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇත. | මු.රෙ. 109 සඳහන් නියමයන් ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂයේ දෙසැම්බර් 23 දින අංක PD-6509 දරන වාහනයට සිදුව තිබුණු අනතුර මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 23 දින අංක PD -6509 දරන රථයට අනතුරකින් සිදු වූ පාඩුව රු.2,161,650 ක් ලෙස 2021 දෙසැම්බර් 28 දිනැතිව තක්සේරු කර ඇතත් හානි වූ පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට ප්‍රමාද වීම නිසා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයටද ඇතුළත් කර නැත. කෙසේ වෙතත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මු.රෙ. 110 නියමයන් අනුව හානි හා පාඩු ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | වර්ෂ 2015 ත් 2019 අතර කාලපරිච්ඡේදය තුළ වාහන අනතුරුවලින් සිදු වූ එකතුව රු.2,399,395 ක හානි වෙනුවෙන් රක්ෂණ සංස්ථාවෙන් රු.1,592,872ක් ද, වගකිවයුතු නිලධාරීන්ගෙන් රු.54,887ක් ද, අයකර ගෙන තිබුණු අතර ඉතිරි රු.751,636 ක හානි සම්බන්ධයෙන් මු.රෙ. 109 පරිදි අස්කිරීමේ නියෝග ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | අංක PG 9781, CAQ 3619, PF 6075, PE-0626 දරන රථවලට සිදු වී තිබුණු හානි සම්බන්ධයෙන් අස්කිරීමේ නියෝග මේ වන විට ලබා දී ඇත. අංක KR- 6496 දරන වාහනයට සිදු වී තිබුණු අනතුර සඳහා මු.රෙ 104(4) වාර්තා සඳහා අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. අංක PG-9781 දරන රථයේ රියදුරුගෙන් අයවිය යුතු රු.30,006 ක මුදල අයකරගෙන අවසන් බැවින් අලාභය කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | මු.රෙ. 109 සඳහන් නියමයන් ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතුය. |
| (ඈ) | අංක **KR-6496** දරන වාහනයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104(4) ප්‍රකාරව **"**අලාභයන් පිළිබඳ අවසන් වාර්තා සකස් කිරීමට පත් කළ කමිටුවේ**"** නිර්දේශ අනුව රජයට සිදු වූ රු.338,755 ක අලාභයෙන් සියයට 15 ක් හෙවත් රු.50,813 ක් රියදුරුගෙන් අයකරගැනීමට තීරණය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ මුදල් අයකරගෙන නොතිබුණි. | අංක KR-6496 දරන රථයේ අනතුරට අදාළව සකස් කරන ලද මු.රෙ. 104(4) අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලැබීමෙන් අනතුරුව රියදුරු වෙතින් අයවිය යුතු මුදල අයකර ගැනීමට ඉදිරි කටයුතු කරනු ලැබේ. | මු.රෙ. 104(4) අනුව ඉදිරිපත්කළ වාර්තාවල සඳහන් නියමයන් පරිදි ක්‍රියාකළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.911,533 ක ණය ශේෂය තුළ ඇතුළත්ව තිබුණු වර්ෂ 16 කට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් සහ වර්ෂ 1 ත් 2 ත් අතර කාලයකට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සේවකයින් 04 දෙනෙකුට අදාළ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අය කර පියවා ඇත. අනෙකුත් සේවකයින් 04 දෙනාට පරිවර්තිත විශ්‍රාම වැටුප හෝ විශ්‍රාම පාරිතෝෂික මුදල් ගෙවීම සිදුවන අවස්ථාවේදී ණය ශේෂ පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වමි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ 5 ට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂ 05 ක් ද ඇතුලුව වැඩ තහනමට ලක් කළ නිලධාරින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග ක්‍රියාත්මක කිරීමටත් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව ඇපකරුගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් ණය අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පැවති වැඩ තහනමට ලක් කළ සේවකයින් 08 දෙනෙකු අතරින් 05 දෙනෙකුගෙන් 2022 ජුනි 17 දින වන විට අයකරගෙන තිබුණු මුදල රු.29,705 ක් වන අතර අනෙකුත් සේවකයින්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රජයේ ඉඩම් කළමනාකරණ කටයුතුවලදී ඒකාබද්ධව කටයුතු කරන රාජ්‍ය ආයතන වන ජනාධිපති ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පරිසර අධිකාරිය, තක්සේරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍ය ආයතන සමග කටයුතු සිදු කිරීමට සහ ඊ - රාජ්‍ය සංකල්පය අනුව රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියේ (e-Slims) කාර්යයන් සිදු කිරීමට ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය (LGN2.0) යොදාගනු ලබන බව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 1/21/ LGN 2.0 දරන 2018 පෙබරවාරි 21 දිනැති ලිපිය මගින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා තිබුණ ද, එම කටයුතු සඳහා ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය භාවිතා නොකිරීම හේතුවෙන් ඊ - රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව දායක වී නොමැති බව නිරීක්ෂණය විය. තව ද, අන්තර්ජාල සේවා ලබා ගැනීම වෙනුවෙන් | සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල, පළාත් සහ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල වල මෙන්ම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තුමේන්තුවේ බොහෝ ඉඩම් රාජකාරි කටයුතු ප්‍රමාණයක් පවත්වාගෙන යාම සඳහා ලංකා ජාල ව්‍යාපෘතිය (LGN) භාවිතා කරන නමුත් එකම කාර්යාලයේ කිහිපදෙනෙක් පද්ධතියට ඇතුලු වීමේදි අන්තර්ජාල පහසුකම මන්දගාමී තත්වයට පත්වීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයේ නියුතු ඉඩම් නිලධාරින් සහ ජනපද නිලධාරින් ක්ෂේත්‍රයට (ඉඩම පිහිටි ස්ථානය) ගොස් ඉඩමට අදාල භූගෝලීය පිහිටීම KML File එකක් ලෙස සහ ඉඩමෙහි පින්තූරයක් සිය ටැබ් යන්ත්‍රය භාවිතා කර ලබා ගෙන පද්ධතියට උඩුගත කිරීම (Upload) සිදු කළ යුතු වේ. එසේ කිරිම සඳහා ප්‍රමාණවත් අන්තර්ජාල පහසුකමක් තිබිය යුතු අතර එම අන්තර්ජාල පහසුකම ලංකා ජාල ව්‍යාපෘතිය (LGN) යටතේ ලබා ගත නොහැක. එම ප්‍රායෝගික ගැටලුකාරි තත්වය අවම | ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියේ (LGN2.0) පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය" සමග කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සන්නිවේදන සමාගම් දෙකකට සමාලෝචිත වර්ෂයේ දී රු.5,368,856 ක වියදමක් දෙපාර්තමේන්තුව දරා තිබුණු අතර LGN2.0 මගින් දෙපාර්තමේන්තුව වෙත අන්තර්ජාල පහසුකම් සැපයීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය විසින් රු.448,586 ක පිරිවැයක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි. | කිරීමේ අරමුණින් වෙනත් ආයතනයක් හරහා අන්තර්ජාල පහසුකම ලබාගැනීම තුළින් වඩාත් කාර්යක්ෂම සහ කඩිනම් සේවාවක් ලබා දීමට හැකියාව ලැබී ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ඉඩම් අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව අනුව ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ ඍජු වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බව හඳුනාගෙන තිබුණු අතර එම ඉඩම්වලට අදාළව, 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට සිදුකරන ලද ඉඩම් බැහැර කිරීම් ඇතුළත් කරමින් සකස්කරන ලද ඉඩම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | රජයේ ඉඩම් පිළිබඳව සංගණනයක් සිදු කර ඉඩම් තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා 2020 වර්ෂයේ අග භාගයේ දී කටයුතු ආරම්භ කර ඇත. රජයේ ඉඩම් බැහැර කිරීම සම්බන්ධ තොරතුරු ලබා ගැනීම ද මෙම තොරතුරු පද්ධතිය සකස් කිරීමේ එක් අරමුණකි. ඊට අදාල තොරතුරු මේ වන විටත් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් එකතු කරමින් පවතී. මෙම වැඩසටහන 2022 ජූනි 30 දිනෙන් අවසන් වීමට තිබුණ ද, රට තුල පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් එකී කාල සීමාව 2022 ඔක්තොම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇත. | බැහැරකර ඇති ඉඩම් ප්‍රමාණය පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |

**4. තිරසර සංවර්ධනය**

--------------------

| විගණන නිරීක්ෂණය<br>-------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| 2021 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව මගින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම දක්වා ඇතත්, දෙපාර්තමේන්තුව සහ පළාත් සභා මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය වෙන්කර දක්වා නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට දෙපාර්තමේන්තුවෙන් ලැබුණු දායකත්වය ඇගයීමට නොහැකි වී තිබුණි. | 2021 කාර්යසාධන වාර්තාවේ 2.1 හි දැක්වෙන වගුවෙහි 1.1.2 යටතේ දැක්වෙන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස්කිරීමට අදාළ ඉලක්කයන් හා ප්‍රගතිය, අන්තර් පළාත් කාර්යාල 08 හි හා පළාත් සභා 09 හි ඉලක්ක හා ප්‍රගතියේ එකතුවක් ලෙස ඉදිරිපත්කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු ලෙස හඳුනාගෙන ඇති බලපත්‍ර නිකුත්කිරීමට දෙපාර්තමේන්තුව සහ පළාත් සභා දායක වන ආකාරය වෙන වෙනම කාර්යසාධන වාර්තා මගින් ඉදිරිපත්කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජොෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්ද ඇතුළුව පුරප්පාඩු 289 ක් පැවති අතර එම තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවය මත අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේතුව සතුව පැවති නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 6 ක් ඉඩම් කොමසාරිස් කාර්යාල බවට පත් කිරීමත් සමඟ ජොෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු ඇති වී ඇති අතර පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය දැනුවත් කර ඇත. තවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහාද රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය වෙත ඉල්ලීම් කර ඇත. ඒ අනුව උක්ත ජොෂ්ඨ මට්ටමේ තනතුරු මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලනය සඳහා අත්‍යවශ්‍ය බැවින් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හැකියාවක් නැත.<br><br>රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධ ඉදිරිපත් කරන ලද අංක 21/1596/304/134 හා 2021/8/31 දිනැති අමාත්‍යමණ්ඩල පත්‍රිකාවේ තිරණය ප්‍රකාරව නව බඳවා ගැනීම් තාවකාලිකව නවත්වා ඇති බැවින් උක්ත පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. තවද ප්‍රාථමික සේවා ගණවල පුරප්පාඩු පිරවීම සඳහා බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් යොමුකර ඇත. | පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවය මත අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |